**ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාව,**
**හම්බන්තොට දිස්ත්‍රික්කය.**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 29 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජුනි 07 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

#### (අ) ගිණුම්කරණ අඩුපාඩු

| | ගිණුම්කරණ අඩුපාඩුව | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ වාර්ෂිකව විවිධ අවසර බලපත්‍ර ලබා ගැනීමට ගෙවූ රු. 221,400 ක් වත්කමක් ලෙස ප්‍රාග්ධනිත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි |
| (ii) | සමාලෝචිත වර්ෂයේදී ඝණ අපද්‍රව්‍ය මධ්‍යස්ථානයේ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා දැරූ රු. 374,525 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | සියලුම ස්ථාවර වත්කම් ගිණුම්ගත කළ යුතුවේ. | ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරමි |
| (iii) | 2016 වර්ෂයේ ඉදිකළ වාහන අංගනයේ පිරිවැය වූ රු. 906,005 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | සියලුම ස්ථාවර වත්කම් ගිණුම්ගත කළ යුතුවේ. | ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරමි |
| (iv) | සමාලෝචිත වර්ෂයේදී ආපදා කළමනාරකණ මධ්‍යස්ථානයෙන් පරිත්‍යාග ලෙස ලැබී තිබූ රු. 63,000 ක් වූ වතුර මෝටරය ප්‍රාග්ධනිත කර නොතිබුණි. | සියලුම ස්ථාවර වත්කම් ගිණුම්ගත කළ යුතුවේ. | ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරමි |
| (v) | ප්‍රාදේශීය සභාව සතු JCB යන්ත්‍රයේ වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | සියලුම ස්ථාවර වත්කම් ගිණුම්ගත කළ යුතුවේ. | වටිනාකම තක්සේරු කර ප්‍රාග්ධනිත කරමි |

| | | | |
|---|---|---|---|
| (vi) | සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම රු. 374,000 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | වර්ෂයේ ආදායම නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2018 වර්ෂයේ දෙවැනි කාර්තුවට අදාළ මුද්දර ගාස්තු උපලේඛන 2019.04.30 දින ලද නිසා ගිණුම් වලට නොගන්නා ලදී |

**(ආ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරිම නිසා එකතුව රු. 6,908,020 ක් වූ ගිණුම් විෂයයන් 02 ක් සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය. | ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීනව පවත්වාගත යුතුවේ. | ස්ථාවර වත්කම් ලේඛන සකස් කිරීමට පියවර ගනිමි |

**1.4 අනුකූල නොවීම**

**1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 193 | අයවැය සමඟ අය හා වැය විෂයයන් සසඳා අතිරික්තතා හා ඌනතා වලට හේතු දැක්වෙන ප්‍රකාශනයක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අය හා වැය විෂයයන් සසඳා ප්‍රකාශයක් පිළියෙල කර ඉදිරිපත් කරමි |
| (ආ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/ 02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | විධිමත් ස්ථාවර වත්කම් ලේඛනයක් සකස් කිරීමට කටයුතු කරමි |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.542,256 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.676,811 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2018 ඇස්තමේන්තුගත ආදායම | 2018 බිල් කළ ආදායම | 2018 රැස් කළ ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2017 ඇස්තමේන්තුගත ආදායම | 2017 බිල් කළ ආදායම | 2017 රැස් කළ ආදායම | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| ව්‍යාපාර බදු | 351,000 | 407,739 | 412,239 | 2,500 | 332,500 | 327,985 | 320,958 | 7,000 |
| කුලී | 4,332,000 | 3,137,025 | 3,139,550 | 120,900 | 2,876,600 | 3,353,360 | 3,233,935 | 123,425 |
| බලපත්‍ර ගාස්තු | 505,100 | 1,596,200 | 1,565,000 | 55,200 | 339,900 | 763,230 | 733,880 | 24,000 |
| වෙනත් ආදායම් | 2,424,000 | 1,763,183 | 1,348,596 | 1,007,922 | 4,652,200 | 2,639,815 | 3,163,325 | 593,335 |
| | 7,612,100 | 6,904,147 | 6,465,385 | 1,186,522 | 8,201,200 | 7,084,390 | 7,452,098 | 747,760 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ රැස්කළ යුතු සමස්ථ ආදායම රු. 7,651,907 ක් වුවද, වර්ෂය තුළ රැස්කරන ලද ආදායම රු. 6,465,385 ක් වීමෙන් ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය සියයට 84 ක් විය. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | විගණන ඡේදය පිළිගනිමි |

### 2.2.3 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය ප්‍රකාරව දියුණු කළ ප්‍රදේශ සම්බන්ධයෙන් වරිපනම් බදු අය කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි. | වරිපනම් අය කිරීමට කටයුතු කළ යුතුවේ. | ග්‍රාම නිලධාරී වසම් ගැසට් කර ලේඛන සකස් කර විෂය භාර ඇමතිතුමාගේ අනුමැතියට යවන ලදී |

### 2.2.4 කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී ලැබිය යුතු කඩ කාමර කුලී රු. 120,900 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ කඩ කුලී කඩිනමින් අයකර ගත යුතුවේ . | රු. 68,900 ක් අයකර ගෙන ඇති අතර ඉතිරි මුදල් ගෙවන ලෙස කඩ හිමියන්ට දන්වා ඇති අතර නොගෙවන කඩ හිමියන්ගේ කඩ කාමර පවරා ගැනීමට 2019 මැයි 24 දින සභාව තීරණය කරන ලදී |

### 2.2.5 බලපත්‍ර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී ලැබිය යුතු බලපත්‍ර ගාස්තු රු. 55,200 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ බලපත්‍ර ගාස්තු අය කිරීමට කටයුතු කළ යුතුවේ. | රු. 11,800 ක් අය කරගෙන ඇති අතර ඉතිරි මුදලින් රු. 40,000 ක් වූ දැන්වීම් පුවරු ගාස්තු ගෙවන ලෙස අදාළ ආයතනය දැනුවත් කර ඇති අතර රු. 3,400 ක මුදල අයකර ගැනීමට ආදායම් පරීක්ෂකට උපදෙස් දුන්නෙමි |

### 2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙලින් රු. 605,422 ක් හා රු. 402,500 ක් විය. | හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු අයකර ගත යුතුවේ. | උසාවි දඩ රු. 405,422 ක් ලැබී ඇති බවත් මුද්දර ගාස්තු සඳහා උපලේඛන ලැබී නොතිබුණි |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) අතුරු ව්‍යවස්ථා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත්, 2018 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 02 ක් සඳහා අතුරු ව්‍යවස්ථා පනවා ගෙන නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවාගත යුතුවේ. | අතුරු ව්‍යවස්ථා කාරණා 28 ක් වැළඳ ගැනීම සිදු කරන ලදී |

**(ආ) තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනා ගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ළඟා කර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | දිගු කාලීන සැලසුම් සකස් කිරීමට පියවර ගන්නා බවත් අඩු ආදායම් ලබන සභාවක් බැවින් සංවර්ධන ඉලක්ක කරා යෑමේ ගැටළු පැවතුණි |

## 3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අනුමත තනතුරුවල පැවති පුරප්පාඩු 13 ක් සම්පූර්ණ කර ගැනීමටත්, 01 ක්වූ අතිරික්ත සේවක සංඛ්‍යාව විධිමත් කර ගැනීමටත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි. | කාර්ය මණ්ඩලයේ අතිරික්ත තනතුරු විධිමත් කරගැනීම හා පුරප්පාඩු පුරවා ගත යුතුවේ . | අතිරික්ත සේවකයා අනුමත කර ගැනීමට මු.රෙ. 71 වාර්තා යවා ඇති අතර, කාර්මික නිලධාරී, ආදායම් පරීක්ෂක පුරප්පාඩු සංවර්ධන නිලධාරීන් මගින් පුරවා ඇති බව සහ ප්‍රාථමික තනතුරු 05 ක පුරප්පාඩු සඳහා අයදුම්පත් කැඳවීම් සිදු කරන ලදී |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභා බල ප්‍රදේශයේ ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීම් පුවරු සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | දැන්වීම් පුවරු සමීක්ෂණයක් සිදු කළ යුතුවේ. | සමීක්ෂණයක් කිරීමට කටයුතු කරමි |
| (ආ) | සභා බල ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන වෛද්‍ය මධ්‍යස්ථාන 02 කින් ප්‍රාදේශීය සභා පනතේ 152(2) වගන්තිය ප්‍රකාරව බදු අයකර නොතිබුණි. | ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව ගාස්තු අයකළ යුතුවේ. | ලිපි මගින් අදාළ ආයතන දැනුවත් කර ඇති අතර ඉදිරියේදී නීතිමය ක්‍රියාමාර්ග ගනිමි |

**3.4 වත්කම් කළමනාකරණය**

**3.4.1 පවරා නොගත් වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී සභාව විසින් බුක්ති විදින ඉඩම් 07 ක, සුසාන භූමි 20 ක, ප්‍රජා ශාලා ඉඩම් 24 ක, ගොඩනැගිලි 10 ක සහ වාහන 04 ක අයිතිය පවරා ගෙන නොතිබුණි. | වත්කම්වල අයිතිය සභාව වෙත පවරාගත යුතුවේ. | ඉඩම් අයිතිය ලබා ගැනීමට ඉඩම් කොමසාරිස් හා ප්‍රාදේශීය ලේකම් වෙත ලිඛිතව දන්වන ලදී |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ආදායම් විෂයයන් 04 ක අහිතකර විචලනයන්ගේ එකතුව රු. 10,480,658 ක් වූ අතර එය සියයට 28සිට සියයට 69ක් දක්වා පරාසයක විය. | තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළ යුතුවේ | සභාවේ මූල්‍ය තත්ත්වය අඩු බැවින් මධ්‍යම රජයෙන් හෝ පළාත් සභාවෙන් මුදල් ලැබිය යුතුය යන පදනම මත ප්‍රාග්ධන අයවැය ඇස්තමේන්තු සකසා ඇත. මුදල් නොලැබීමෙන් වැය ශීර්ෂවල ඉතිරි වීම් පවතී |
| (ආ) | වියදම් විෂයයන් 07 ක එකතුව රු. 9,468,961 ක් වූ ඉතිරිවීම් පැවති අතර එය සියයට 31 සිට සියයට 100 ක පරාසයක විය. | තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළ යුතුවේ | මුදල් නොලැබීමෙන් වැය ශීර්ෂවල ඉතිරිවීම් පවතී. |